# ස්වයං රැකියාවක් වශයෙන් කුකුල් පාලනය

බිත්තර සහ මස් සඳහා කුකුලන් ඇතිකිරීම ග්‍රාමීය පෙදෙස්වල මෙන්ම නගරාසන්නව ද අඩු ප්‍රාග්ධනයකින් හා ශ්‍රම සූක්ෂම වශයෙන් කළහැකි ස්වයං රැකියාවකි. කුකුළු පාලන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම හා පවත්වාගෙන යන අන්දමත්, එයින් සතුටුදායක ප්‍රතිඵල ලබාගැනීම සඳහා පිළිපැදිය යුතු උපදෙස් මොනවාද යන්න පැහැදිළි කරදීමත්, මෙම ලිපියේ අරමුණයි.

කුකුලන් ඇතිකිරීම මගින් සුළු ප්‍රාග්ධනයකින් සැලකිය යුතු ආදායමක් කෙටි කාලයකදී ලබා ගැනීමට හැකිය. එමෙන්ම එය නිතිපතා ආදයම් ලැබෙන ස්ථිර ආදයම් මාර්ගයක් බවට පත්කර ගැනීමට ද පුළුවන. කුකුළු පාලනයෙහි අවදනම්ද නැත්තේ නොවේ. බෝවන රෝග සහ වෙනත් හේතූන්ගෙන් ඇතැම්විට ව්‍යාපෘතිය මුළුමනින්ම වුවද විනාශවී යා හැකි නමුත්, ඉතාමත් සැලකිල්ලෙන් හා ක්‍රමවත් පාලනයකින් යුතුව පවත්වාගෙන යන්නේ නම් එම අවදනම ඉතාමත් අඩුකරගත හැකිය.

කුකුල් ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වන්නේ නම් කළයුතු පළමු දෙය බිත්තර සහ කුකුළු මස් සඳහා දැනට පවත්නා වෙළඳපල පිළිබඳව පරීක්ෂා කර බැලීමයි. පාරිභෝගිකයාට සාධාරණ මිලකට කුකුල් මස් සහ බිත්තර ලබාගැනීමේ පහසුකම තිබේ නම් බොහෝ විට ඒ සඳහා ගම්බද ප්‍රදේශවල වුවද සෑහෙන වෙළඳපලක් ඇතිකරගත හැකිවේ. ඇත්ත වශයෙන්ම යෙදවුම් වල වර්තමාන වෙළඳපල මිළ ගණන් අනුව බිත්තර එකක් හෝ කුකුල් මස් කිලෝග්‍රෑම් එකක් නිෂ්පාදනය කොට වෙළඳපලට ඉදිරිපත් කිරීමේදී ඒ සඳහා වන සාමාන්‍ය නිෂ්පාදන වියදම සහ එම ද්‍රව්‍ය විවෘත වෙළඳපලේ අලෙවි කරනු ලබන මිල ගණන් අතර සැලකිය යුතු පරතරයක් (ලාභයක්) තිබෙන හෙයින් ඒවා සඳහා වෙළඳපල හිතකර යයි කිව හැකිය. (බිත්තරයක නිෂ්පාදන වියදම දළ වශයෙන් ශත 90 ක් පමණ වන අතර, කුකුල් මස් කිලෝග්‍රෑම් එකක් සඳහා වියදම රුපියල් 28 ක් පමණ වේ.) ඔබ ජීවත්වන ප්‍රදේශය නගරාසන්නව පිහිටියේ නම්, සමහර විට වාණිජමය වශයෙන් මහා පරිමාණ අන්දමින් මෙම ව්‍යාපෘතිය කරගෙන යනු ලබන වෙනත් පුද්ගලයින් සමග ඔබට තරඟ කිරීමට සිදුවිය හැකි වුවත්, එම හේතුව නිසාම ඔබ නිසි අන්දමින් එම ව්‍යාපෘතිය හැදෑරීමෙන් පසුව, ඔබට ඔබගේ ව්‍යාපෘතිය සඳහා ද විශාල වෙළඳපලක් ලබාදීමට සමත්වීමට පුළුවන.

කුකුල් පාලන ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට ප්‍රථම ඔබ විසින් සිතා බැලිය යුතු තවත් දෙයක් නම් ඔබ කුකුල් පාලනය කිරීමට අදහස් කරන්නේ බිත්තර නිෂ්පාදනය සඳහා ද, නැත හොත් මස් නිෂ්පාදනය සඳහා ද යන්නයි. මස් සඳහා කුකුලන් ඇති කිරීමේ ඇති ප්‍රධාන වාසිය නම් ඉතා ඉක්මනින් ආදයම ලැබීමට හැකි වීමයි. මස් පිණිස ඇති කරන කුකුලන් ඉක්මනින් වැඩෙන නිසා වයස සති 5–6 ක් ඇතුළතදී එම කුකුලන් වෙළඳපලට යැවීමට සුදුසු වන බරින් සහ ප්‍රමාණයෙන් යුක්තවේ. එහෙත් බිත්තං දමන කිකිලියන්ට වඩා ඔවුන් ලෙඩ රෝගවලට ලෙහෙසියෙන් ගොදුරු වන හෙයින් බර අඩුවීමෙන් හා මිය යාමෙන් ඇති විය හැකි අවදනම ද අධික විය හැක. එසේ ම, බොහෝ විට ගම්බදව මස් බෙහෙවින් පරිභෝජනය කරනු ලබන්නේ උත්සව හෝ එවැනි විශේෂ අවස්ථාවලදී පමණක් හෙයින්, ඒ සඳහා ස්ථාවර වෙළඳපලක් සොයා ගැනීම ද දුෂ්කර විය හැකිය. වර්තමානයේ කුකුල් මස් වෙළඳපල ආර්ථික වශයෙන් ශක්තිමත් පුද්ගලික ව්‍යාපාරිකයින් කිහිප දෙනෙකු විසින් පාලනය කෙරෙන හෙයින් ද, සුළු පරිමාණ කුකුල් මස් නිෂ්පාදකයිනට වෙළඳපලට ඇතුළුවීම සඳහා සැලකිය යුතු වෙහෙසක් දැරීමට සිදුවනු ඇත.

බිත්තර දමන කිකිලියන් පමණක් ඇති කිරීමේ ප්‍රධාන අවාසිය වන්නේ එම සතුන්ගෙන් බිත්තර ලබා ගැනීම සඳහා ඔබට මාස 6 ක් පමණ බලා සිටීමට සිදුවීමයි. මස් විකිණීම මෙන් නොව ආදයම ලැබෙන්නේ ද කාලයක් මුළුල්ලේ බැවින් ඔබගේ ආයෝජනය එල දැරීම සඳහා සැලකිය යුතු කාලයක් බලා සිටීමට ද සිදුවේ. එහෙත් කිකිලියන් බිත්තර දැමීම ආරම්භ කළාට පසුව, අවුරුද්දක් පමණ ගතවන තෙක්, වෙළඳපලට නොකඩවා බිත්තර සැපයීමට ඔබට හැකි වෙයි. ග්‍රාමීය ප්‍රදේශවල පවා බිත්තර පරිභෝජනය සැළකිය යුතු අන්දමින් ව්‍යාප්ත වී ඇති අතර, බිත්තර පරිභෝජනය ග්‍රාමීය ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීමට උපකාරී වේ. විශේෂයෙන් කුඩා ළමයින්ගේ ඉක්මන් වැඩීමට බිත්තරවල සාරවත් බව මස්වලට වඩා උපකාරී වෙයි. වෙනත් මස් වර්ග සහ මාළුවල මිල ගණන්වලට සාපේක්ෂ වශයෙන් කුකුල් මස් මිළ ගණන් අධික නොවන අතර, නුදුරු අනාගතයේ දී වෙනත් මස් මාළු වර්ගවල මිල ගණන් කුකුල් මස්වල මිල ගණන්වලට වඩා වැඩිවීමට ද පුළුවන. කෙසේ වුව ද, මස් සහ බිත්තර යන අරමුණු දෙක සඳහාම ව්‍යාපෘතිය ආරම්භ කිරීම඼ඥාන්විතය. ඔබ ඒ පිළිබඳව දක්ෂයකු නම් ඉතා කෙටි කලකින් ව්‍යාපෘතිය සඳහා ඔබ යෙදූ මුදල් ආපසු ලබාගත හැකිවන අතර, නැවත ආයෝජනය සඳහා අවශ්‍ය මුදල් එමගින් ඉතිරි කර ගැනීමට ද පුළුවන.

## සුදුසු පැටවුන් ලබා ගැනීම හා ප්‍රවාහනය

දිනක් වයසැති කුකුල් පැටවුන් බිත්තර රක්වන ස්ථානයකින් ලබාගත හැකිය. බිත්තර රක්වන ස්ථානයන්හි එම පැටවු වර්ග කර තැබීමෙන් (ගැහැණු සහ පිරිමි වශයෙන්) ගොවියාට පහසුවෙන් බිත්තර සඳහා ගැහැණු සතුන් මිලදී ගත හැකි වන නමුත්, සමහර විට එම පැටවුන් සමග 2% ක පමණ පිරිමි කුකුල් පැටවුන් ලැබීමට ද ඉඩකඩ ඇත. කිකිලියන් එකිනෙකා පොරකොටා ගැනීමෙන් වලකා තබා ගැනීම පිණිස කුකුලන් උපකාර වන නමුත් කිකිලියන්ට බිත්තර දැමීම සඳහා කුකුලන් අත්‍යවශ්‍යම නොවේ. එසේම කුකුලන්ගේ කෑගැසීම නිසා කිකිලියන් තුළ තිබෙන වැඩුණු බිත්තර ඉතා ඉක්මණින් විනාශ වන බව ද දැනගත යුතුය. එහෙයින්

කිකිලියන්ගෙන් කුකුලන් ඉවත් කිරීම වඩා ප්‍රයෝජනවත් ය. එමගින් බිත්තර දැමීම සඳහා කුකුළන් අවශ්‍යය යන වැරදි විශ්වාසය ද මිනිසුන් තුළින් ඉවත් කළ හැකිවනු ඇත. සතුන් නිරෝගීමත් වීම සඳහා අවශ්‍ය ඖෂධ එන්නත් කිරීම බිත්තර රක්වන ස්ථානයේ දී සිදුකළ යුතුය. පැටවු මිලදීගන්නා සෑම විටකම එම පැටවුන් 'මැරෙක්ස්' රෝගය සඳහා එන්නත් කරගත යුතුය. ඊට අමතරව පැටවුන්ට වයස මාසයක් වන විට 'කුකුල් පැපොල්' රෝගයටත්, වයස මාස 3 ක් වන විට 'රැනිකට්' රෝගයටත් පශු වෛද්‍යවරයකු ලවා එන්නත් කරවා ගත යුතු වේ.

මස් සඳහා ඇති කිරීමට ගනු ලබන පැටවුන්ට පිරිමි සහ ගැහැණු යන දෙවර්ගයෙන්ම සතුන් ඇතුළත් විය හැකි අතර, එයින් පිරිමි සතුන්ගෙන් ප්‍රශ්නයක් ඇති වීමට ප්‍රථම ඔවුන් විකුණා දැමිය යුතුවේ. කුකුළු පැටවුන් බිත්තරයෙන් එළියට පැමිණ පැය 24 සිට 48 දක්වා කාලයක් ගතවනතුරු ඔවුන්ට කෑම, වතුර හෝ අමතර උෂ්ණත්වයක් අවශ්‍ය නොවේ. එහෙයින් පැටවුන් ප්‍රවාහනය කිරීමට වඩාත් උචිත කාලසීමාව මෙය වේ. එහිදී ප්‍රමාණවත් වාතාශ්‍රය ලැබිය හැකි පරිදි සිදුරු සහිත පෙට්ටියක ඔවුන් දැමිය යුතු අතර, සාමාන්‍ය ප්‍රමාණයේ පෙට්ටියක පැටවුන් 50 කට වඩා නොදැමිය යුතුය. සැහෙන දුරක පිහිටි ස්ථානයක වෙත උන් ගෙන යන්නේ නම්, එම පැටවුන් සහිත පෙට්ටි සම මට්ටමකින් තැබීමට ද වගබලා ගත යුතුය. සෑම විටකම පෙට්ටිය වියළි ස්වභාවයකින් යුක්ත විය යුතුය. පැටවුන් ඉපිද පැය 48 කට පසුව හෝ උන් නියමිත ස්ථානයට ගෙන ගොස් රැකබලා ගැනීම ආරම්භ කළ තැන් පටන් උන්ට ආහාර, වතුර සහ අවශ්‍ය උෂ්ණත්වය නිසි ප්‍රමාණයෙන් ලබාදිය යුතුය. පැය 48 ගතවීමට පෙර කුමන අන්දමකින් හෝ එම සතුන් නියමිත වැඩෙන ස්ථානයක් වෙත ගෙන ගොස් තිබිය යුතුය.

මව් කිකිලියගෙන් පැටවාට ලැබිය යුතු සියළුම සැප පහසුකම් කුකුල් කූඩුව තුළදී ලබාදීමට හැකිවන පරිදි එය සියළුම උපකරණයන්ගෙන් සමන්විත විය යුතුය. එය නියමිත උෂ්ණත්වයෙන් හා වියළි ස්වභාවයෙන් යුක්ත විය යුතුයි. කුඩා කුකුළු පැටවෙකු තෙතමනයට හසු වුවහොත් ඌ ඉක්මණින් මරණයට පත්වීමට පුළුවන. ප්‍රමාණවත් උණුසුමක් ලැබිය හැකි පරිදි ලී වලින් තනන ලද විශාල පෙට්ටියක් කූඩුව තුළ ඇත්නම් වඩාත් යෝග්‍යවේ. බිත්ති සාමාන්‍යයෙන් පොළොවේ සිට මිලිමීටර් 500 ක් (අඟල් 20 ක්) උස්විය යුතුය. බිමට සහ බිත්ති වටා අළුතින් සන කාඩ්බෝඩ් ඇතිරීම වඩාත් යෝග්‍ය වේ. බිත්ති මුලු කාඩ්බෝඩ් යොද රවුම් කළ යුතුය. නොඑසේ නම් සීත අවස්ථාවලදී කුකුළු පැටවුන් බිත්ති මුලුවලට වී එකිනෙකා උඩ නැගීමෙන් පහතින්ම සිටින පැටවාට හානි සිදුවීමට පුළුවන. කුකුලන් ආරක්ෂා කර ගැනීමේ ඉතාමත් හොඳම සහ පහසුම ක්‍රමය වන්නේ ඔබගේ නිවෙසට ඉතාමත් ආසන්නවම කුකුල් ගොවිපල පවත්වාගෙන යැමයි. එමගින් බාහිරව පැමිණෙන සතුන්ගෙන් සිදුවන හානි, මිනිසුන් නිතර ගැවසීම නිසා මඟ හැරෙන අතර, ආරක්ෂාව උදෙසා කූඩුව වටා තාප්ප වැනි දේ ඉදිකිරීම ද අවශ්‍ය නොවේ.

කූඩුවෙහි ගෙබිම අඟල් 3 ක් හෝ 4 ක් ඝනකමට වියළි රොඩු දැමීමෙන් පැටවුන් සඳහා ගෙබිම සකස්කර ගත හැකිය. එම රොඩුවලට යටින් කාඩ්බෝඩ් ඇතිරීමෙන් කූඩුව පහසුවෙන් පිරිසිදු කළ හැකි වේ. කුකුලන්ගේ අපවිත්‍ර ද රොඩු වලට උරාගනු ලබන අතර, එය පැටවුන්ට පහසුවක් ද ගෙන දෙයි. රටකජු පොතු, දහයියා, උක් රොඩු, ලී කුඩු හෝ වියළි වැලි ආදිය යෙදීමෙන් කූඩුව වියළි ගතියෙන් හා දූවිලි රහිතව තබාගත හැකිවේ. කුඩා පැටවුන් විසින් ගනු ලබන ආහාර ඔවුන්ගේ ශරීරයේ ගබඩා කර තබාගන්නා ස්ථානයෙහි (ශරීරයෙහි විශේෂ ඉන්ද්‍රියයක්) වර්ධනය සඳහා ඉතා උපකාරී වන හෙයින් වියළි වැලි මතුපිට ඇතිරීම වඩාත් සුදුසුය. කෑම බඳුන් තබන ස්ථානයන්හි රොඩුවලට මතුපිටින් කඩදාසියක් එලීමෙන් උන්ට දෙනු ලබන කෑම, රොඩු සමග මිශ්‍රවීම වලක්වාගත හැකිය. සති තුනකින් හෝ හතරකට වරක් නැවත අමතර රොඩු ප්‍රමාණයක් එකතු කිරීම කළ යුතු අතර, එමගින් කූඩුව තුළින් ඇතිවන අප්‍රියජනක දුර්ගන්ධය වළක්වා ගැනීමටද උපකාරී වේ.

## උෂ්ණත්වය

කුකුල් පැටවුන් උණුසුම් සහගතව තැබිය යුතුය. පැටවුන්ගේ වයස සතියක් පමණ වන විට සෙන්ටිග්‍රේඩ් අංශක 35 ක (ෆැරන්හයිට් අංශක 95 ක) උෂ්ණත්වයක් තුළ සිටීමට කැමති වේ. ඉන්පසුව සතියෙන් සතිය එම උණුසුම ක්‍රමයෙන් සතියකට සෙන්ටිග්‍රේඩ් අංශක 3 (ෆැරන්හයිට් අංශක 5) බැගින් බාහිර උෂ්ණත්වයට ගැලපෙන තෙක් අඩු කළ යුතුය. සමහර ප්‍රදේශයන්හි දිනපතා දවල් සහ රාත්‍රී කාලය තුළ ලන්තෑරුම් දෙකක් ආරම්භයේදී මේ සඳහා අවශ්‍ය වන අතර, සතුන්ට උෂ්ණත්වය අඩුවෙන් අවශ්‍ය වන විට එක් ලන්තෑරුමක් නොකඩවා ද, අවසානයේ එක් ලන්තෑරුමක් රාත්‍රී කාලයේ පමණක් ද දැල්වීම ප්‍රමාණවත් වේ. මේ සඳහා භූමිතෙල් ලන්තෑරුම් වෙනුවට විදුලි බල්බ ද යොදගත හැකිය. වහලට යොදන ඇලුමිනියම් තහඩු වැනි යම් ලෝහමය ආවරණයකින් කූඩුව ඇතුළත ආවරණය කරන්නේ නම් ඇතුළත උෂ්ණත්වය රඳවා තබාගත හැකිවේ.

(මහ බැංකුවේ ගැමි ණය තොරතුරු ප්‍රකාශනයෙන් උපුටා ගන්නා ලදි)

---

**ඉතිරි කොටස ලබන කලාපයේ**

---